# 5 ඒකකය
# බිම් සැකසීම

(1) අවම බිම් සැකැස්ම වඩාත් සුදුසු වනුයේ,
1) අපිභෞම ප්‍රරෝහණයක් සහිත බෝගවලට ය.
2) අධෝභෞම ප්‍රරෝහණයක් සහිත බෝගවලට ය.
3) කුඩා බීජ සහිත බෝගවලට ය.
4) විශාල බීජ සහිත බෝගවලට ය.
5) තද බීජාවරණයක් සහිත බෝගවලට ය. (2000)

(2) පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) අවම බිම් සැකැස්ම මගින් පස් තදවීම වැඩි වේ.
2) සාම්ප්‍රදායික ලෙස බිම් සැකසූ පසකට වඩා වේගයෙන් ශුන්‍ය බිම් සැකසූ පසක් වියළේ.
3) අවම බිම් සැකැස්ම හා ශුන්‍ය බිම් සැකැස්ම අතර වෙනසක් නැත.
4) අවම බිම් සැකැස්මට යන වියදම අඩු බැවින් ආන්තික ඉඩම් වගා කිරීමට ඉඩ ලැබේ.
5) අවම බිම් සැකැස්මට සාපේක්ෂව සාම්ප්‍රදායික බිම් සැකැස්ම සඳහා උපකරණ අවශ්‍යතාවය අඩු ය. (2000)

(3) ද්විතියක බිම සැකැසීමේ උපකරණයකට උදාහරණයක් වනුයේ,
1) මෝල්ඩ් බෝඩ් නගුල ය.
2) දේශීය නගුල ය.
3) ජපන් රොටරි වීඩරය ය.
4) තැටි පෝරුව ය.
5) යටි පස බුරුල් කරන නගුල (Subsoil chisel) ය. (2001)

(4) කුඹුරු මඩ කිරීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,
1) පාංශු ව්‍යුහය දියුණු කිරීමයි.
2) පාංශු වයනය දියුණු කිරීමයි.
3) පාංශු ව්‍යුහය විනාශ කිරීමයි.
4) පාංශු වයනය විනාශ කිරීමයි.
5) පාංශු වාතනය දියුණු කිරීමයි. (2002)

(5) ශුන්‍ය බිම සැකසීම පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) මූලික බිම සැකසීම පමණක් සිදු කෙරේ.
2) ද්විතීයික බිම් සැකසීම පමණක් සිදු කෙරේ.
3) පස සම්පූර්ණයෙන්ම කුඩු කෙරේ.
4) වල්නාශක වැඩිපුර භාවිත කෙරේ.
5) පාංශු ඛාදනය වැඩි කෙරේ. (2002)

(6) පාංශු ව්‍යුහය විනාශ කරනුයේ,
1) ශුන්‍ය බිම සැකසීමේ දී ය.
2) අවම බිම් සැකසීමේ දී ය.
3) යටි පස ඇවිස්සීමේ දී ය.
4) ගැඹුරු සී සෑමේ දී ය.
5) මඩ කිරීමේ දී ය. (2003)

(7) බිම සැකසීම,
1) ජල සන්නායකතාව, දෘශ්‍ය ඝනත්වය සහ අහඹු රළු බව වැඩි කරන අතර සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය අඩු කරයි.
2) ජල සන්නායකතාව, දෘශ්‍ය ඝනත්වය සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය වැඩි කරන අතර අහඹු රළු බව අඩු කරයි.
3) ජල සන්නායකතාව, අහඹු රළු බව සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය වැඩි කරන අතර දෘශ්‍ය ඝනත්වය අඩු කරයි.
4) දෘශ්‍ය ඝනත්වය, අහඹු රළු බව සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය වැඩි කරන අතර ජල සන්නායකතාව අඩු කරයි.
5) දෘශ්‍ය ඝනත්වය සහ අහඹු රළු බව වැඩි කරන අතර ජල සන්නායකතාව සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය අඩු කරයි. (2003)

(8) ගැඹුරු සී සෑම,

1) අස්වැන්න වැඩි කරයි. බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. නමුත් පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු කරයි.
2) අස්වැන්න සහ පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කරන අතර බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි.
3) පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව ඉහළ නංවන අතර බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. නමුත් අස්වැන්න අඩු කරයි.
4) අස්වැන්න සහ පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කරන නමුත් බහු වාර්ෂික වල් පැළ මර්දනය නොකරයි.
5) අස්වැන්න සහ පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු කරන අතර බහු වාර්ෂික වල් පැළ පාලනය කරයි. (2003)

(9) අවම බිම් සැකසීම,

A) රළු වයනයක් සහිත පසකට වඩා යෝග්‍යයි.
B) පාංශු ඛාදනය අඩු කරයි.
C) කාබනික ද්‍රව්‍ය වියෝජනය කරන වේගය වැඩි කරයි.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,

1) A පමණි. 2) A සහ C පමණි. 3) B සහ C පමණි.
4) A සහ B පමණි. 5) A,B සහ C යන සියල්ලම වේ. (2003)

(10) වියළි කලාපයේ බෑවුම් සහිත බිමක් හිමි ගොවියෙකුට එහි විශාල බීජ සහිත බෝගයක් සිටුවීමට අවශ්‍යව ඇත. ඔහුගේ ක්ෂේත්‍රය සඳහා වඩාත් උචිත බිම් සැකසීම වනුයේ,

1) මඩ කිරීමය. 2) තැටි නගුලෙන් සී සෑම ය. 3) පෝරු ගෑම ය.
4) අවම බිම් සැකසීමය. 5) කැට පොඩි කිරීම ය. (2004)

(11) ගැඹුරු සී සෑම,

1) පාංශු ව්‍යුහය විනාශ කරයි. බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. පාංශු වාතනය දියුණු කරයි.
2) පාංශු ව්‍යුහය විනාශ කරයි. රෝග හා පළිබෝධ පාලනය කරයි. නමුත් අස්වැන්න අඩු කරයි.
3) පාංශු ව්‍යුහය විනාශ කරයි. බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. පසෙහි ජලය රඳා සිටීමේ ධාරිතාව දියුණු කරයි.
4) පාංශු ව්‍යුහය දියුණු කරයි. පසෙහි ජලය රඳා සිටීමේ ධාරිතාව දියුණු කරයි. නමුත් අස්වැන්න අඩු කරයි.
5) බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. වාතනය දියුණු කරයි. නමුත් පසෙහි ජලය රඳා සිටීමේ ධාරිතාව අඩු කරයි. (2004)

(12) බෝග සංස්ථාපනයේදී බීජ සිටුවිය යුතු ගැඹුර,

A) බීජයේ ප්‍රමාණය සහ බීජයේ සංචිත ආහාර ප්‍රමාණය මත රඳා පවතී.
B) බීජයේ ජීව්‍යතාව සහ බීජයේ අඩංගු ජල ප්‍රමාණය මත රඳා පවතී.
C) බීජාග්‍රපයේ දිග සහ පසේ අඩංගු තෙතමන ප්‍රමාණය මත රඳා පවතී.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,

1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) A සහ Bපමණි. 5) A සහ C පමණි. (2004)

(13) බහුලව භාවිත වන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකට උදාහරණයක් වනුයේ,

1) පෝරුව ය. 2) රොටරි වල් නෙලන උපකරණය ය. 3) සවල ය.
4) ස්ක්‍රේපරය (scraper) ය. 5) නගුල ය. (2005)

(14) ගොඩ බෝග වගාබිමක (upland crop field) බිම් සැකසීමේ දී පසේ,

1) දෘශ්‍ය ඝනත්වය වැඩි වේ. 2) දෘශ්‍ය ඝනත්වය අඩු වේ.
3) දෘශ්‍ය ඝනත්වය වෙනස් නොවේ. 4) අංශු ඝනත්වය වැඩි වේ.
5) අංශු ඝනත්වය අඩු වේ. (2005)

(15) ශුන්‍ය බිම් සැකසීමේ දී,
1) කිසිම වල්නාශකයක් භාවිත නොකෙරෙයි.
2) අනෙකුත් බිම් සැකසීමේ ක්‍රමවලට සාපේක්ෂව අඩු වල්නාශක ප්‍රමාණයක් භාවිත කෙරෙයි.
3) අනෙකුත් බිම් සැකසීමේ ක්‍රමවලට සාපේක්ෂව වැඩි වල්නාශක ප්‍රමාණයක් භාවිත කෙරෙයි.
4) පූර්ව නිර්ගමන වල්නාශක පමණක් භාවිත කෙරෙයි.
5) පශ්චාත් නිර්ගමන වල්නාශක පමණක් භාවිත කෙරෙයි. (2005)

(16) සිදුකරනු ලබන කාර්යයෙන් හා ලැබෙන ප්‍රතිඵලයෙන් තැටි නගුලකට සමාන වන උපකරණය වනුයේ,
1) භ්‍රමණ නගුල (rotary tiller) ය. 2) ටැන්ඩම් තැටි පොරුව (trandem disk harrow) ය.
3) මෝල්ඩ්බෝර්ඩ් නගුලය. 4) දැති පොරුව ය.
5) භ්‍රමණකය ( rotavator) ය. (2006)

(17) එක්තරා බිම් සැකසුම් ක්‍රමයක දී බීජය තැන්පත් කිරීමට කුඩා සිදුරක් සෑදීම හැර පාත්තියක් සැකසීමක් සිදු නොවේ. මෙම බිම් සැකසීම හඳුන්වනුයේ,
1) අවම බිම් සැකසීම ලෙස ය. 2) ප්‍රාථමික බිම් සැකසීම ලෙස ය.
3) ශුන්‍ය බිම් සැකසීම ලෙස ය. 4) යටි පස ඇවිස්සීම (subsoiling) ලෙස ය.
5) ද්විතීයික බිම් සැකසීම ලෙස ය. (2006)

(18) හොඳ බෝග සංස්ථාපනයක් සඳහා මනාව සකස් කළ පාත්තියක් අවශ්‍ය වනුයේ,
1) විශාල බීජ සහිත බෝගවලට ය. 2) වර්ධකව ප්‍රචාරණය කෙරෙන බෝගවලට ය.
3) කුඩා බීජ සහිත බෝගවලට ය. 4) සියලුම පළතුරු බෝගවලට ය.
5) ඉහත සඳහන් කිසිවක් නොවේ. (2006)

(19) ගැඹුරු සී සෑම,
1) දෘශ්‍ය ඝනත්වය වැඩි කරයි, පාංශු වාතනය දියුණු කරයි, මුල් වර්ධනය අඩු කරයි.
2) පසේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය දියුණු කරයි, ජලය රඳාගැනීමේ ධාරිතාව වැඩි කරයි, දෘශ්‍ය ඝනත්වය අඩු කරයි.
3) පස් පැතිකඩ වර්ධනය කරයි, ජලය රඳාගැනීමේ ධාරිතාව වැඩි කරයි, පාංශු වාතනය අඩු කරයි.
4) ජලවහනය දියුණු කරයි, දෘශ්‍ය ඝනත්වය වැඩි කරයි, ජලය රඳවාගැනීමේ ධාරිතාව අඩු කරයි.
5) පස් පැතිකඩ වර්ධනය කරයි, පසේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය දියුණු කරයි, දෘශ්‍ය ඝනත්වය අඩු කරයි. (2006)

(20) බිම සැකසීමේ දී තැටි පෝරුව ප්‍රධාන වශයෙන් භාවිත වනුයේ,
1) ප්‍රාථමික බිම් සැකසීමේ (primary tillage) දී ය.
2) යටිපස ඇවිස්සිමේ (sub soiling) දී ය.
3) ද්විතියික බිම් සැකසීමේ (secondary tillage) දී ය.
4) ශුන්‍ය බිම් සැකසීමේ (zero tillage) දී ය.
5) අවම බිම් සැකසීමේ (minimum tillage) දී ය. (2007)

(21) බිම සැකසීමේ එක්තරා ක්‍රමයක දී පාත්ති සැකසීමකින් තොරව බීජය තැන්පත් කිරීම සඳහා භූමියේ සිදුරක් පමණක් සාදන ලදී. මෙය හොඳින්ම විස්තර කළ හැක්කේ,
1) ප්‍රාථමික බිම් සැකසීම ලෙස ය. 2) ද්විතියික බිම් සැකසීම ලෙස ය.
3) අවම බිම් සැකසීම ලෙස ය. 4) ශුන්‍ය බිම් සැකසීම ලෙස ය.
5) අතුරු යත්ගෑම ලෙස ය. (2007)

(22) හොඳ බෝග සංස්ථාපනයක් සඳහා බීජ සිටුවන ගැඹුර තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු වනුයේ,
1) බීජයේ ප්‍රමාණය, සංචිත ආහාර ප්‍රමාණය, බීජාග්‍රපයේ දිග හා පසේ තෙතමන ප්‍රමාණයයි.
2) බීජයේ ප්‍රමාණය, බීජ පොත්තේ ඝන බව, බීජ ලපයේ ප්‍රමාණය හා බීජයේ තෙතමන ප්‍රමාණයයි.
3) බීජයේ හැඩය, වර්ධිකාවේ ප්‍රමාණය, බීජ මූලයේ දිග හා බීජ මූලපයේ ප්‍රමාණයයි.
4) බීජයේ හැඩය, බීජ පොත්තේ ඝන බව, බීජ මූලයේ දිග හා බීජයේ තෙතමන ප්‍රමාණයයි.
5) බීජයේ වර්ණය, අනුද්වාරයේ ප්‍රමාණය, බීජ පත්‍රවල ප්‍රමාණය හා භ්‍රෑණ පෝෂයේ ප්‍රමාණයයි.
(2007)

(23) නගුල බහුලව යොදා ගැනෙනුයේ,
1) අතුරු යත්ගෑමේ දී ය.
2) ප්‍රාථමික බිම් සැකසීමේ දී ය.
3) ද්විතියික බිම් සැකසීමේ දී ය.
4) ශුන්‍ය බිම් සැකසීමේ දී ය.
5) අවම බිම් සැකසීමේ දී ය. (2007)

(24) ගොඩබිම්වල බිම් සැකසීමේ පරමාර්ථයක් වනුයේ,
1) පසේ වර්ණය වෙනස් කිරීමයි.
2) පසේ ප්‍රතිරෝධීතාව වැඩි කිරීමයි.
3) පාංශු අංශු ඝනත්වය අඩු කිරීමයි.
4) පසේ වයනය වෙනස් කිරීමයි.
5) පසේ දෘශ්‍ය ඝනත්වය අඩු කිරීමයි. (2008)

(25) බිම් සැකසීමේ දී තැටි නගුල භාවිතයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,
1) පස පෙරළීම, වාතනය දියුණු කිරීම හා වල් පැළ පාලනයයි.
2) කුඩා පස් අංශු ලබා ගැනීම, තද ස්ථරය සෑදීම හා වාතනය දියුණු කිරීමයි.
3) කුඩා පස් අංශු ලබා ගැනීම හා වල් පැළ පාලනයයි.
4) ජලවහනය දියුණු කිරීම හා සියුම් අංශුවලින් යුත් පාත්තියක් ලබා ගැනීමයි.
5) රෝග හා පළිබෝධ පාලනය හා සියුම් අංශුවලින් යුත් පාත්තියක් ලබා ගැනීමයි. (2008)

(26) බිම් සැකසීම යොදා ගැනෙනුයේ,
1) වල් පැළ විනාශ කිරීමට ය.
2) පාංශු සුසංහනය (Compaction) වැඩි කිරීමට ය.
3) පාංශු ඛාදනය අඩු කිරීමට ය.
4) ජලවහනය අඩු කිරීමට ය.
5) පාංශු වාතනය අඩු කිරීමට ය. (2009)

(27) කෘෂිකර්මාන්තයේ දී බිම් සැකසීමේ ක්‍රියා සමහරක් පහත දක්වේ.
A – පස හැරීම හා පෙරළීම.
B – මතුපිට මට්ටම් කිරීම හා මටසිලිළු කිරීම.
C – ගල් හා ආගන්තුක ද්‍රව්‍ය ඉවත් කිරීම.
ඉහත සඳහන් දෑ අතුරෙන් ද්විතීයික බිම් සැකසීමේ ක්‍රියාව / ක්‍රියා වනුයේ,
1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A හා B පමණි.
5) B හා C පමණි. (2009)

(28) රූප සටහනෙහි දැක්වෙන නගුලේ තලයෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ,

1) නගුල නිසි පරිදි තබා ගැනීමට උදව් වීම ය.
2) සී සාන පළල වැඩි කිරීම ය.
3) පස පෙරළීම ය.
4) කම්පනය අවම කිරීම ය.
5) පසෙහි කැට පොඩි කිරීම ය. (2009)

(29) බිම් සැකසීමේ දී මෝල්ඩ්බෝර්ඩ් නගුල යොදා ගන්නේ,
1) පස පෙරළීමට, වාතනය වැඩි දියුණු කිරීමට හා වල් පාලනයට ය.
2) කුඩා පස් අංශු ලබාගැනීමට, තද ස්ථරයක් ඇති කිරීමට හා වාතනය දියුණු කිරීමට ය.
3) කුඩා පස් අංශු ලබාගැනීමට, තද ස්ථරය කැඩීමට හා වල් පාලනයට ය.
4) ජලවහනය දියුණු කිරීමට, පස් අංශු කැඩීමටහා සියුම් අංශුවලින් යුත් පාත්තියක් ලබා ගැනීමට ය.
5) ජලවහනය දියුණු කිරීමට, රෝග හා පළිබෝධ පාලනයට හා සියුම් අංශුවලින් යුත් පාත්තියක් ලබා ගැනීමට ය. (2010)

(30) එක්තරා ගොවියෙකුට පැළ තවානක් ස්ථාපිත කිරීටම අවශ්‍ය වී ඇත. මෙ සඳහා භූමිය සකස් කර, ඝන අවර්ණ පොලිතින්වලින් එය ආවරණය කර අනතුරුව එහි කෙළවරවල් පස්වලට යටි කර මුද්‍රා තබන ලෙස ඔහුට උපදෙස් ලැබී ඇත. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,
1) පසෙහි සාරවත් බව ඉහළ නැංවීම ය.
2) පසෙහි වයනය ඉහළ නැංවීම ය.
3) පසෙහි තෙතමන හානිය පාලනය කිරීම.
4) රෝග පාලනය කිරීම ය.
5) වල් මර්දනය කිරීම ය. (2010)

(31) මෝල්ඩ් බෝර්ඩ් නගුල ප්‍රධාන වශයෙන් භාවිත කරන්නේ,
1) ප්‍රාථමික බිම් සැකසුම් උපකරණයක් ලෙස ය.
2) ද්විතීයික බිම් සැකසුම් උපකරණයක් ලෙස ය.
3) මට්ටම් කිරීමේ උපකරණයක් ලෙස ය.
4) මිනිස් ශ්‍රමයෙන් ක්‍රියාකරන උපකරණයක් ලෙස ය.
5) සත්ත්ව ශ්‍රමයෙන් ක්‍රියාකරන උපකරණයක් ලෙස ය. (2011)

(32) වී වගාව සඳහා බිම් සැකසීමේ දී පසේ ව්‍යුහය,
1) වෙනස් නොවේ. 2) වැඩි දියුණු වේ. 3) විනාශ වේ.
4) සුසංහනය වේ. 5) අඩු වේ. (2011)

(33) කළු පැහැති පොලිතීන්වලින් පසට වසුනක් යෙදීමෙන්,
A – පස උණුසුම් වීම නිසා කලින් අස්වනු ලැබීමට හේතු වේ.
B – උචිත පරිසර තත්ත්වයන් ලැබීම නිසා පළිබෝධ ආසාදන වැඩි වේ.
C – අයහපත් වර්ධන තත්ත්වයක් ලැබීම නිසා වල් පැළෑටි වර්ධනය අඩු වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) A හා B පමණි. 5) A හා C යන සියල්ලම. (2011)

(34) ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණු වන්නේ,
A – අහඹු රළු බව වැඩි කිරීම ය.
B – දෘශ්‍ය ඝනත්වය වැඩි කිරීම ය.
C – සච්ඡිද්‍රතාව වැඩි කිරීම ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි. 2) A හා B පමණි. 3) A හා C පමණි.
4) B හා C පමණි. 5) A ,B හා C සියල්ලම ය. (2011)

(35) ශිෂ්‍යයන් කණ්ඩායමක් ප්‍රාථමික බිම් සැකසීමට පෙර හා පසුව පාසල් වත්තෙහි පාංශු ලක්ෂණ නිරීක්ෂණය කිරීමෙන් පසුව,
1) වයනය හා සත්‍ය ඝනත්වය වෙනස් වී නැති නමුත් සච්ඡිද්‍රතාව වෙනස් වී ඇති බව සොයා ගන්නා ලදී.
2) දෘශ්‍ය ඝනත්වය වෙනස් වී ඇති නමුත් සච්ඡිද්‍රතාව හා ව්‍යුහය වෙනස් වී නැති බව සොයා ගන්නා ලදී.
3) ව්‍යුහය වෙනස් වී ඇති නමුත් අහඹු රළු බව හා වයනය වෙනස් වී නැති බව සොයා ගන්නා ලදී.
4) වයනය හා ව්‍යුහය වෙනස් වී ඇති නමුත් සත්‍ය ඝනත්වය වෙනස් වී නැති බව සොයා ගන්නා ලදී.
5) සත්‍ය ඝනත්වය වෙනස් වී ඇති නමුත් අහඹු රළු බව හා දෘශ්‍ය ඝනත්වය වෙනස් වී නැති බව සොයා ගන්නා ලදී. (2012)

(36) පසක කැට පොඩි කිරීමට වඩාත් උචිත බිම් සැකසීමේ උපකරණය වනුයේ,
1) මෝල්ඩ්බෝර්ඩ් නගුල ය. 2) තැටි නගුල ය.
3) සතුන් මගින් අදින යකඩ නගුල ය. 4) මට්ටම් ලැල්ල ය.
5) තැටි පෝරුව ය. (2013)

(37) බිම් සැකසීමේ අරමුණ වනුයේ,
1) අහඹු රළු බව, දෘශ්‍ය ඝනත්වය සහ සච්ඡිද්‍රතාව වැඩි කිරීම ය.
2) සච්ඡිද්‍රතාව අඩු කරන අතර, අහඹු රළු බව හා දෘශ්‍ය ඝනත්වය වැඩි කිරීම ය.
3) දෘශ්‍ය ඝනත්වය අඩු කරන අතර, අහඹු රළු බව හා සච්ඡිද්‍රතාව වැඩි කිරීම ය.
4) අහඹු රළු බව අඩු කරන අතර, සච්ඡිද්‍රතාව හා දෘශ්‍ය ඝනත්වය වැඩි කිරීම ය.
5) අහඹු රළු බව, දෘශ්‍ය ඝනත්වය හා සච්ඡිද්‍රතාව වැඩි කිරීම ය. (2013)

(38) බෝග නිෂ්පාදනයේ දී භාවිත කරනු ලබන ශස්‍ය විද්‍යාත්මක ක්‍රියාවන් කිහිපයක් පහත දක්වේ.
A – වල් පැළ පාලනය.
B – කාබනික ද්‍රව්‍ය එකතු කිරීම.
C – බිම් සැකසීම සඳහා රෝද හතරේ ට්‍රැක්ටර් යොදා ගැනීම.
D – නිර්දේශිත පරතරය සහිතව බෝග සිටුවීම.
ඉහත ක්‍රියා අතුරෙන් පස සංරක්ෂණය කළ හැකි ක්‍රියා වනුයේ,
1) A හා B පමණි. 2) B හා C පමණි. 3) A, B හා C පමණි.
4) A, B හා D පමණි. 5) B, C හා D පමණි. (2014)

(39) 2014 වසරේ මුල් කාලයේ දී ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශ තුළ ගවයන් හා ගවමස් ප්‍රවාහනය කිරීම සීමා කරනු ලැබේ.

1) ගව රක්තපාත රෝග වසංගතය නිසා ය.
2) කුර හා මුඛ රෝග වසංගතය නිසා ය.
3) වයිරස් උණ රෝග වසංගතය නිසා ය.
4) ඇන්ත්‍රැක්ස් රෝග වසංගතය නිසා ය.
5) කාල ගාත්‍ර රෝග වසංගතය නිසා ය. (2014)

(40) බෝග ක්ෂේත්‍රයක ගුණාංග කිහිපයක් පහත දක්වේ.

A – සච්ඡිද්‍රතාව B – දෘශ්‍ය ඝනත්වය C – ජල සන්නායකතාව D – ශාක සංයුතිය

ඉහත ගුණාංග අතුරෙන් බිම් සැකසීම නිසා වෙනස් වන පාංශු භෞතික ගුණාංග වනුයේ,

1) A හා B පමණි. 2) C හා D පමණි. 3) A, B හා C පමණි.
4) B, C හා D පමණි. 5) A, B, C හා D සියල්ලම ය. (2015)

(41) ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකට උදාහරණයක් වනුයේ,

1) මට්ටම් පෝරුව 2) රොටවේටරය 3) තැටි නඟුල
4) තැටි පෝරුව 5) දැති පෝරුව (2016)

(42) පහත සඳහන් වන්නේ තවාන් පාත්ති සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A – වැලි තවාන් පාත්ති ප්‍රධාන වශයෙන් භාවිත කරන්නේ බීජ ප්‍රචාරණයට ය.
B – උස් පාත්ති ප්‍රධාන වශයෙන් භාවිත වන්නේ තෙත් කාලයේ දී ය.
C – බෝගවලට සිදුවන කෘමි පළිබෝධ හානි අඩු ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් ක්ෂුද්‍ර ජල සම්පාදනයේ වාසිය / වාසි වනුයේ,

1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) A සහ B පමණි. 5) B සහ C පමණි. (2016)

## 5 ඒකකය

## බිම් සැකසීම

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (2) | 4 | (3) | 4 | (4) | 3 | (5) | 4 | (6) | 5 | (7) | 3 | (8) | 2 |
| (9) | 4 | (10) | 4 | (11) | 3 | (12) | 5 | (13) | 5 | (14) | 2 | (15) | 3 | (16) | 3 |
| (17) | 3 | (18) | 3 | (19) | 2 | (20) | 3 | (21) | 4 | (22) | 1 | (23) | 2 | (24) | 5 |
| (25) | 1 | (26) | 1 | (27) | 5 | (28) | 3 | (29) | 1 | (30) | 5 | (31) | 1 | (32) | 3 |
| (33) | 3 | (34) | 3 | (35) | 1 | (36) | 5 | (37) | 3 | (38) | 4 | (39) | 3 | (40) | 3 |
| (41) | 3 | (42) | 2 | | | | | | | | | | | | |